## Cultivating The Spirit of “not giving up' [25/11/18] Sam J

## අතහැර නොදැමීමේ ආත්මය ඇතිකර(වගාකර)ගැනීම

2 කොරින්ති 4:16-18 එහෙයින් අපි අත් නොහරින්නෙමු. අප එසේ කරන්නේ කෙසේද! අපේ පිටත මනුෂ්‍යයා දිරාපත්වන බව පෙනුනත් අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත් කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ අමාරුයැයි සිතන, සැහැල්ලුවූ දුක දැන් අපට පෙනෙන දේ නොව නොපෙනෙන දේවල් ගැන බලා සිටින අපට සදාකාල තේජස් සම්භාරයක් සාදා දෙන්නේය. අපට පෙනෙන අද තිබී හෙට නැතිවී යන තාවකාලික දේවලට වඩා අපට නොපෙනෙන දේවල් සදාකාලිකව පවතිනු ඇත.

අත් හැර නොදමන්න-දෙවියන්වහන්සේ පිළිබඳව දේවල් අපට අත්හැරිය හැක්කේ කෙසේද!

දෙවියන්වහන්සේ අපව අත්හැර දැම්මේ නැත- අප උන්වහන්සේ ගැන කිසිම ගෞරවයක්, තැකීමක් හෝ සිතීමක්වත් නොකළත් උන්වහන්සේගේ පුත්‍රයා වූ යේසුස්වහන්සේ එවූසේක. ලෝකය වියවුල්ව තිබුණි, දේවභක්තිකයන් ලෙස හැසිරුනු නමුත් බලයක් නොතිබුන බොහෝ ආගමික මිනිස්සු සිටියහ. මිනිස්වර්ගයා කෙරෙහි කිසිවිටක අත්හැර නොදමන ආකාරයේ සැලසුමක් දෙවියන්වහන්සේට තිබුණි. එම නිසයි උන්වහන්සේ තුළින් නව ජීවනයක් දීමට සහ උන්වහන්සේගේ රාජ්‍යය පිහිටුවන පිණිස, වෛරයෙන් සහ කැරලිකාරකමෙන් පිරුණු මේ ලෝකයට යෙසුස්වහන්සේ ආවේ. උන්වහන්සේගේ ප්‍රේමය, උන්වහන්සේගේ අනුග්‍රහය සහ උන්වහන්සේගේ බලය අප පිටුපස ලුහුබැඳ හඹා එමින් පවතී.

ලූක් 19:10 සාකෙවුස්ගේ නිවසේදී යේසුස්වහන්සේ: “මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූවන් සොයන්ටත් ගලවන්ටත් ආවේය”යි කීසේක. යේසුස්වහන්සේ සොයන්ටත් ගලවන්ටත් පැමිණි නිසා ඔබ ඉතාමත්ම අසීරු, අමාරු අවස්ථාවේ සිටින විටත් යේසුස්වහන්සේගේ ප්‍රේමය ඔබව සොයාගනියි.

දෙවියන්වහන්සේ අප ගැන අත්හැර දැම්මේ නැත. උන්වහන්සේ අපගේ මිනිසත්කමේ දුක්බිත තත්වය දෙස බලා, අප සිටිය යුතුයැයි උන්වහන්සේට අවශ්‍ය කළ ආකාරයට-උන්වහන්සේගේ දරුවන් ! බවට අපව නැවත පත්කරවන පිණිස යම්දෙයක් කළසේක- උන්වහන්සේ අපව දූවිල්ලෙන් “පස්” වලින් රැගෙන යම්කිසි අලංකාර දෙයක් කළසේක. මැටි වන අප දෙස බලා දෙවියන්වහන්සේ පත්විය හැකිව, කළහැකිව තිබෙන දේවල් දකිනසේක. ඔබ තුළ පැලකර තිබෙන දේව වචනය නමැති බීජය පැලවී තබා ගැනීමට ඉඩ නොමැතිව උතුරා යන තරම් අස්වැන්නක් නිපදවනවා ඇත. බීජයක් පැලවෙන්නට පස් අවශ්‍යවේ. උන්වහන්සේගේ අභිප්‍රායන් ඉටුකිරීම සඳහා  දෙවියන්වහන්සේට යේසුස්වහන්සේ තුළින් ඔබව අවශ්‍යවේ- එමනිසා  දෙවියන්වහන්සේ ගැන හෝ උන්වහන්සේ ඔබ ගැන තබා තිබෙන දේවල් ගැන අත්හැර නොදමන්න.

වැදගත්වන්නේ ඇතුල් පැත්තයි- සිත-  පිටතින් බලනවිට පෙනෙන්නේ අපේ දේවල් අපගෙන් ගිලිහී යනවා මෙන්ය, උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ඇතුල් පැත්තේ දෙවියන්වහන්සේ යම් අලුත් දෙයක් කරමින් සිටිනසේක- බීජය, වචනය, අප අතර වාසය කරන පිණිස පැමිණි “යේසුස්වහන්සේ” ජීවමාන වචනයයි, අප තුළ පවතින වචනය, නැවත දේවල් ඇතිකරවන වචනය අප තුළ වාසය කරනසේක. සත්‍යතාවයේ ආත්මයාණෝ, අපගේ සැනසිලි -කාරයාණෝ සහ උපකාරකයාණෝ අප තුළ පවතිනසේක නැතහොත් අප සමග වාසය කරනසේක- එබැවින් අප පරාජය විය නොහැක ! (යොහන් 14:16-17)

අප පාවුල්තුමාගේ ජීවිතය දෙස බැලුවොත් ඔහු දේශනාකළ අවස්ථාවලදී බොහෝවිට පීඩා, පරීක්ෂා සහ ආපදාවලට මුහුණපෑවේය. නමුත් එක් දවසකදී මේ සියල්ලම හමාරවී ඔහු දෙවියන්වහන්සේගේ විවේකය සහ ත්‍යාග හිමිකර ගනු ලබන බව ඔහු දැන සිටියේය. කරදර සහ පීඩාවලට අප මුහුණදෙන විට අවසානයේ ඇති ඉලක්කයට වඩා වේදනාව ගැන අවධානය යොමුකිරීම පහසුය. ක්‍රීඩකයෙක් නිතරම වේදනාව දරාගන්නට සිදුවුනත් අමාරුකම් ගැන නොතකා අවසානයේ දිනුම්කණුව කෙරෙහි තිබෙන ඉලක්කය දෙස බලාගෙන අවධානය යොමුකරන්නාක් මෙන් ජයග්‍රහණයේ මොහොත රසවිඳින පිණිස අපටද සමහර අවස්ථාවලදී වේදනා සහ පීඩා තුළින් යන්නට සිදුවේ. ගීතාවලිය 51:10 දාවිත් රජු මෙසේ යාච්ඤා කළේය:      දෙවියන්වහන්ස, මා තුළ අලුත්, පවිත්‍ර සිතක් මැවුව මැනව. පවිත්‍ර සිතුවිලිවලින් සහ නිවැරදි ආශාවන්ගෙන් පුරවනු මැනව. (මැසේජ්) දෙවියන්වහන්ස, මා තුළ අලුත් ආරම්භයක් කළ මැනව.

වේදනාව හෝ අපහසුතා වලට කිසිම කෙනෙක් කැමති නොවන අතර ඒවා කෙසේ හෝ මගහැරීමට වෑයම් කරති. ඒ කෙසේ වුවත් බොහෝ විට අප දකින දෙයක් නම් වේදනා සහ අභියෝගයන් තුළින් අප වඩාත් ශක්තිමත් වන, දැඩි වන සහ පහසුවෙන් ඇදෙන අය බවට පත්වන බවයි. යේසුස්වහන්සේ සමග යන අපේ ගමනේදී බොහෝවිට අපට බර, පීඩා, වේදනා මෙන්ම බලාපොරොත්තු කඩවීම් පවා දරා ගැනීමට සිදුවේ. ඒත් අප ඒවා තුළින් ගොස් එළියට එන විට අප ඒවා තුළින් ඇදගෙන ඒමේ සහ එම බාධක ජයගැනීමේ සතුට දැන ගන්නෙමු. අභියෝග නොතිබුණා නම් ජීවිතය නීරස වෙනු ඇතුවා සේම දෙවියන්වහන්සේගේ නොපරදින බලය ගැන අප දැන නොගනු ඇත. එබැවින් අමාරු කාලයන් දරා ගැනීමට සූදානම් වෙන්න, මක්නිසාද ඉන්පසුව ඔබ අලුත්කර ප්‍රාණවත් කරන කාලයන් පැමිණෙන කාලය එන්නේය. එමනිසා මේ

ජීවිතයේ අපට මොනවා සිදුවුනත් කමක් නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් අපට සදාකාල ජීවනය පිළිබඳව ස්ථාවරත්වයක් තිබෙන බැවින් අපිත් අපේ ඇදහිල්ලේ ත්‍යාගය සහ සදාකල් පවතින ප්‍රීතිය කෙරෙහි අවධානය යොමුකළ යුතුවේ. හාලේලූයා !

පිලිප්පි 3:14 හි පාවුල් කළා මෙන් ඉලක්කය දෙස බලන්න. නමුත් එකක් කරමි. ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමින් (නුපුරුදු මහා වෑයමක් කිරීමට බලය යොමු කිරීමකට) දිවීමේ කෙළවරට ළඟාවීමට සහ තෑග්ග ලබා ගැනීමට, එනම් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ අප උදෙසා කළ දේ නිසා දෙවියන්වහන්සේ අපව ස්වර්ගයට කැඳවනසේක. (මැසේජ්) මිත්‍රයෙනි මා ගැන වරදවා නොසිතන්න; කිසිම ආකාරයකින් මම සියල්ලෙහිදී අති දක්ෂයෙක් යැයි ගණන් නොගනිමි. නමුත් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පල කරා ඇස් රඳවාගෙනම දුවමි. මම දුවමින් සිටින්නෙමි, එසේම මම ආපසු නොහැරෙමි. අප කරන හොඳ හෝ නරක සෑම දේකම සදාකාල සුවිශේෂත්වයක් තිබේ !

යේසුස්වහන්සේ තුළ අපට අපූරු අනාගතයක් සහ අපූරු ඉලක්කයක්ද දැනටමත් අප වෙනුවෙන් සූදානම් කරන ලද ස්ථානයක්ද තිබේ. නමුත් දෙවියන්වහන්සේ අපව අත්හැර නොදමන බැවින් එම වෙලාව එනතුරු "අත්හැර නොදමන ආත්මයකින්" අප මෙම දිවීම දුවමු.

අද ඔබ ඒ අත්හැර දමන තැන සිටින්නේ නම් ඔබට දෙවියන්වහන්සේගෙන් අලුත් පටන් ගැන්මක් ඉල්ලිය හැකියි. මතක තබාගන්න යේසුස්වහන්සේ සමග අපේ ඇදහිල්ලේ ගමන වේගයෙන් කෙටි දුරක් දිවීමක් නොවේ මැරතන් ධාවන තරගයකි. දෙවියන්වහන්සේ සමග අපට පුලුවනි !

යේසුස්වහන්සේ ඔබට ප්‍රේමකරනසේක, ඔබ සමග සම්බන්ධතාවයක් තබා

ගැනීමට කැමතිවනසේක. උන්වහන්සේ ඔබට ප්‍රීතියෙන් සහ අරමුණකින් පිරුණු ජීවිතයක් දීමට කැමතිවනසේක.

අතීතයේ පාප සහ වැරදුණු තැන්වලට ගොස් ඔබේ ගල්ලෑල්ල මකා පිරිසිදුකර ඔබට වෙනස් කරන්නට බැරි තැන්වලට, ගොස් ඔබේ අතීතය වෙනස් කරන්නට යේසුස්වහන්සේට පුලුවනි. ඔබේ අතීතයේ දේවල් ඉවත්කර, පිරිසිදු කර තිබේ. යේසුස්වහන්සේ ඊයේ මෙන්ම අදත් සදාකාලයටමත් එසේම සිටින අතර ඔබ කෙරෙහි ඇති උන්වහන්සේගේ ප්‍රේමය කිසිදාක ඔබව අත්හැර නොයයි, වියළී නොයයි, අඩු නොවෙයි. ඔබ ගැන නරකම පැත්ත යේසුස්වහන්සේ දන්නාසේක. ඒත් උන්වහන්සේ ඔබේ හොඳම පැත්ත ගැන විශ්වාස කරනසේක. ඒ ඇයි? උන්වහන්සේ ඔබව දකින්නේ ඔබ සිටින ආකාරයෙන් නොව උන්වහන්සේ ඔබ සමග ක්‍රියාකළ පසුව ඔබ උන්වහන්සේගේ දරුවෙකුව සිටින ආකාරයෙන් නිසාය. උන්වහන්සේ අපූරු මිත්‍රයෙකි ! ඔබ උදෙසා යේසුස්වහන්සේට විශාල සැලසුමක් තිබේ. ඔබට උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකියි. උන්වහන්සේගේ සැලසුම් ඔබට විපතක් කරන පිණිස නොව, ඔබේ යහපත පිණිසය. ඔබට අනාගතයක් සහ බලාපොරොත්තුවක් (ප්‍රීතිමත් අපේක්ෂාවක් /අනාගතයක් ගැන කලින් බලාපොරොත්තුවීමක්) දෙන පිණිසය. ඔබේ සෑම යාච්ඤාවකටම යේසුස්වහන්සේ ඇහුම්කන් දෙනසේක.

ඔබට මේ යේසුස්වහන්සේ ගැන දැන ගැනීමට අවශ්‍යද? යේසුස්වහන්සේ කියා තිබෙන නිසා ඔබ යේසුස්වහන්සේ කියන දේ කරන්නට කැමතිවෙනවාද?

යාච්ඤාව: ප්‍රේමනීය යේසුස් ස්වාමින්වහන්ස, මාගේ ජීවිතයේ මා කර තිබෙන වැරදි ගැන මම කණගාටු වෙමි. මම මාගේ පව් ගැන පසුතැවිලිවී ඔබගෙන් මම සමාව ඉල්ලන්නෙමි. මාගේ පාපයෙන් මා නිදහස් කරන පිණිස කුරුසියේ මැරුණාට ස්තුතියි. යේසුස්වහන්ස මාගේ ජීවිතයට වැඩිය මැනව. යේසුස්වහන්ස, ඔබ මාගේ ස්වාමින්වහන්සේ සහ ගැලවුම්කරුවාණන් ලෙස විශ්වාස කරමි. ස්වාමින්වහන්ස, ඔබගේ ශුද්ධාත්මයෙන් මාව පිරවුව මැනව. මා සමග නිතරම සිටිය මැනව. ආමෙන් !